# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - අපොස උසස් පෙළ මොඩියුලය

## ඉගෙනුම් ඵල

1. සන්නිවේදන අධ්‍යයනයෙහි ආරම්භය විකාශය හා වැදගත්කම පැහැදිලි කරයි
2. ශ්‍රී ලංකාවේ සන්නිවේදන අධ්‍යනය විෂය හඳුන්වාදීම පැහැදිලි කරයි
3. සන්නිවේදන වර්ග නම් කිරීම සන්නිවේදන වර්ග වල ලක්ෂණ වෙන් වෙන්ව හඳුනා ගැනීම
4. සන්නිවේදන වර්ග වල ප්‍රයෝජන හා සන්නිවේදනයේ යෙදෙන අවස්ථා පැහැදිලි කිරීම
5. විවිධ සන්නිවේදන ස්වරූප නම් කරයි, සන්නිවේදන ස්වරූප වල ලක්ෂණ හා භාවිතය පැහැදිලි කරයි.

**පළමු වන ඒකකය - සන්නිවේදනය අධ්‍යයනෙයහි ආරම්භය හා එහි විකාශනය**

1 සන්නිවේදන අධ්‍යනය ස්වාධීන විෂයක් ලෙස ආරම්භ වීමට පෙර කුමන විෂයයන් යටතේ ඉගැන්වූයේ ද?

1.මනෝ විද්‍යාව

2.සමාජ විද්‍යාව

3. දේශපාලන විද්‍යාව

2. සන්නිවේදන අධ්‍යයනය ශාස්ත්‍රීය විෂයක් ලෙස ඉගැන්වීමට පදනම සකස් කළ විද්වතුන් තිදෙනා සහ ඔවුන්ගෙ කෘති මොනවාද?

| නම | කෘතිය | ක්ෂේත්‍රය |
|---|---|---|
| චාල්ස් කූලී | සමාජ සංවිධානය | සමාජ විද්‍යාව |
| වොල්ටර් ලිප්මන් | ජනමතය | දෙශපාලන විද්‍යාව |
| ජෝන් ඩූවි | ජනතාව හා ඔවුන්ගෙ ගැටලු | අධ්‍යාපන විද්‍යාව |

3. ඔවුන් තිදෙනා දැරූ පොදු මතය කුමක්ද?

පුද්ගලයාගේ සමාජ ජීවිතයේ වැදගත්ම සහ කේන්ද්‍රීය සාධකය සන්නිවේදනය වේ

4. සන්නිවේදන අධ්‍යයනය ශාස්ත්‍රීය විෂයක් ලෙස සංවර්ධනයට කටයුතු කළ විද්වතුන් පස් දෙනෙකු නම් කරන්න.

1. හැරල් ඩී ලැස්වෙල්
2. විල්බර් ශ්‍රාම්
3.වොරන් වීවර්
4. ජෝර්ජ් ගාබ්නර්
5. කර්ට් ලෙවින්

5. සන්නිවේදන අධ්‍යානය විෂය ශාස්ත්‍රීය විෂයක් ලෙස ඉගැන්වීම ආරම්භ කළ පළමු විශ්වවිද්‍යාලය කුමක්ද? ඇමරිකා එක්සත් ජනපදය - ඉලිනොයිස් විශ්වවිද්‍යාල

6. සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රය පිළිබඳව ශාස්ත්‍රීය වශයෙන් අධ්‍යානය කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන මොනවාද?

1. ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් සන්නිවේදන ක්‍රියාදාමය හා මාධ්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ අවබෝධය

2. විචාරශීලීව මාධ්‍ය පරිහරණය කිරීමේ කුසලතා වර්ධනය

3. අවශ්‍ය අදාල තොරතුරු තෝරා ගැනීමේ හැකියාව

4. යහපත්,ආචාරශීලි හා ඵලදායි මානව අන්තර් සම්බන්ධතා ඇතිකර ගැනීම

5. සමාජ ප්‍රගමනය සඳහා සක්‍රීය දායකත්වය

6. ගවේෂණශීලීභාවය විචාරශීලී චින්තනය දියුණුවීම

7. මාධ්‍ය සාක්ෂරතාවය

8. නිර්මානාත්මක චින්තනය හා මාධ්‍ය සන්දේශ නිර්මානණය

9. සංවර්ධනාත්මක හා ප්‍රජාතන්ත්‍රවාදී චින්තනයෙන් පෝෂණය වූ පුරවැසියකු වීමට අවශ්‍ය දැනුම ආකල්ප කුසලතා හා පුරුදු

10 මාධ්‍ය අධ්‍යයනයන්හි ක්‍රියාකාරීත්වය පිළිබඳ අවබෝධය පුද්ගලයකු තුළ ගොඩ නැගීම

7. විල්බර් ශ්‍රාම් විසින් කරන ලද සන්නිවේදන මෙහෙවර කෙටියෙන් දක්වන්න.

1.ජනමාධ්‍ය පාසල් ආරම්භ කිරීම

2. සන්නිවේදන පර්යේෂණ ආයතන ස්ථාපිත කිරීම

3. විශ්වවිද්‍යාලය සඳහා නව අධ්‍යයන අංශ ආරම්භ කිරීම

8. ශ්‍රී ලංකාවේ ප්‍රථමවරට සන්නිවේදන අධ්‍යානය විෂය ශාස්ත්‍රීය පාඨමාලාවක් ලෙස ඉගැන්වීම් කළ ආයතනය නම්කරන්න? එම පාඨමාලාව කුමක්ද?

ආයතනය -දෙහිවල කනිෂ්ඨ විශ්ව විද්‍යාලය පාඨමාලාව- පුවත්පත් කලාවේදය

9. ශ්‍රී ලංකාවේ ප්‍රථමවරට සන්නිවේදන අධ්‍යානය විෂය සඳහා අධ්‍යයන අංශයක් ආරම්භ කළ විශ්ව විද්‍යාලය නම්කරන්න.

කැලණිය විශ්ව විද්‍යාලය

10 1973 වසරේ දී කැලණිය විශ්ව විද්‍යාලයේ ජනසන්නිවේදන අධ්‍යයනාංශය ආරම්භ කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරන ලද කමිටුවේ සාමාජිකයන් , විශ්වවිද්‍යාලෙය් ඉගැන්වීම් කළ විද්වතුන් නම් නරන්න

| **කමිටු සාමාජිකයන්** | **ප්‍රථම අභ්‍යන්තර කථිකාචාර්යවරු** | **ප්‍රථම බාහිර කථිකාචාර්යවරු** |
|---|---|---|
| මහාචාර්ය විමල් දිසානායක | මහාචාර්ය විමල් දිසානායක | ආචාර්ය එඩ්වින් ආරියදාස |
| මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර | මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර | ආචාර්ය පියසෝම මෙදිස් |
| මහාචාර්ය එම් බී ආරියපාල | | ආචාර්ය ඩී බී නිහාල්සිංහ |
| මහාචාර්ය කයිලාසපති | | කේ ජයතිලක |
| මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර | | පණ්ඩිත් ඩබ්ලිව් ඩී අමරදේව |
| අාචාර්ය එඩ්වින් අාරියදාස | | ඩී සී රණතුංග |
| ඩී.සී රණතුංග | | පියසිරි ගුණරත්න |
| | | මහගම ෙස්කර |

11. වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යනය විෂය උගන්වන විශ්වවිද්‍යාල නම් කරන්න

| විශ්වවිද්‍යාල | පාඨමාලා |
|---|---|
| කැලණිය විශ්වවිද්‍යාලය | සහතික පත්‍ර ඩිප්ලෝමා |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | සාමාන්‍ය උපාධි |
| කොළඹ විශ්වවිද්‍යාලය | විශේෂ උපාධි |
| කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපය | පශ්චාත් උපාධි |
| රජරට විශ්වවිද්‍යාලය | ආචාර්ය උපාධි පාඨමාලා |
| විවෘත විශ්වවිද්‍යාලය | |
| නැගෙනහිර විශ්වවිද්‍යාලයෙ ත්‍රිකුණාමලය මණ්ඩපය යාපනය | |

12. පාසල් විෂයයක් ලෙස සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය ආරම්භ කළ වර්ෂ හා පන්ති මොනවාද?

| **පන්තිය** | **වර්ෂය** |
|---|---|
| 10 වන ශ්‍රේණිය | 2006 |
| 11 වන ශ්‍රේණිය | 2007 |
| 12 වන ශ්‍රේණිය කලා විෂය ධාරාව | 2008 |
| 13 වන ශ්‍රේණිය කලා විෂය ධාරාව | 2009 |

13. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යනය විෂය හැදෑරීමේ අවශ්‍යතාව ලැයිස්තු ගත කරන්න.

1. සන්නිවේදන කුසලතා වර්ධනය
2. මාධ්‍ය සාක්ෂරතාවය
3. නිර්මාණශීලී සන්නිවේදන කුසලතා
4. විචාරශීලී මාධ්‍ය පරිහරණය
5. අවස්ථානෝචිත භාෂා භාවිතය
6. මාධ්‍ය හා සංස්කෘතිය පිළිබඳ අවබෝධය
7. මාධ්‍යයේ පුද්ගල හා සමාජ බලපෑම්
8. තොරතුරු පරිහරණය කිරීමේ අවබෝධය
9. මාධ්‍ය ආචාර ධර්ම හා නියාමනය පිළිබඳ අවබෝධය
10. යහපත් පුරවැසියකු ලෙස සංවර්ධනයට දායක වීම

ඇගයීම 1

01. සන්නිවේදන අධ්‍යනය ශාස්ත්‍රීය විෂයක් ලෙස ස්වාධීන වීමට පෙර කුමන විෂය යටතේ ඉගැන්වූද?

1. මනෝ විද්‍යාව, දෙශපාලන විද්‍යාව ,ඉංග්‍රීසි භාෂාව
2. මනෝ විද්‍යාව සමාජ විද්‍යාව දේශපාලන විද්‍යාව
3.සමාජ විද්‍යාව පරිසර විද්‍යාව ආර්ථික විද්‍යාව
4. දේශපාලන විද්‍යාව අධ්‍යාපන මනෝ විද්‍යාව ආර්ථික විද්‍යාව
5. අධ්‍යාපන විද්‍යාව සමාජ විද්‍යාව මනෝ විද්‍යාව

02. නව සම්බන්ධතා පැවැත්වීමේ හා වර්ධනය කිරීමේ යාන්ත්‍රණය සන්නිවේදනය බව ප්‍රකාශ කරන ලද්දේ,

1. වෝල්ටර් ලිප්මන් 2. චාල්ස් කූලී 3. ජෝන් ඩුවි 4. විල්බර් ශ්‍රාම් 5.ක්ලොඩ් ෂැනන්

03. අපේ දරුවෝ අපි කියන කිසිම දෙයක් අහන්නේ වත් කරන්නෙවත් නෑ රූපවාහිනිය දිහා ඔහේ බලාගෙන ඉන්නවා දෙමවුපියන්ගේ මෙබඳු මැසිවිලි පිළිබඳ පර්යේෂණාත්මක පිළිතුරක් ප්‍රථම වරට සපයන ලද්දේ

1. කර්ට් ලෙවින් 2. විල්බර් ශ්‍රාම් ය 3. ජෝර්ජ් ගාබ්නර්

4. පොල් ලැසාර්ෆීල්ඩ් ය 5 වෝල්ටර් ලිප්මන් ය

04. පෙර පාසලේ සිට විශ්ව විද්‍යාල මට්ටම දක්වාත් වැඩිහිටි අධ්‍යාපනය තුළත් මාධ්‍ය අධ්‍යාපන වැඩසටහන් ආරම්භ කළ යුතු බව සඳහන් ප්‍රකාශය කුමක්ද?

1.ජිනීවා ප්‍රකාශය 2. පැරිස් ප්‍රකාශය 3. කොළඹ ප්‍රකාශය
4.ගෲන්වල්ට් ප්‍රකාශය 5. ප්‍රංශ ප්‍රකාශය

05 ජන මතය නම් කෘතිය රචනා කරන ලද්දේ

1. චාල්ස් කූලිය 2. ජෝන් ඩුවි ය 3 .වෝල්ටර් ලිප්මන් ය 4. ශැනොන් වීවර් 5. විල්බර් ශ්‍රාම් ය

06. සන්නිවේදන අධ්‍යනය ශාස්ත්‍රීය විෂයක් ලෙස ඉගැන්වීම් ආරම්භ කළ ලෝකයේ පළමු විශ්වවිද්‍යාලය වන්නේ

1. ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලය 2. ඉලිනොයිස් විශ්වවිද්‍යාලය 3. කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලය 4.කැලණිය විශ්වවිද්‍යාලය 5. දිල්ලි විශ්ව විද්‍යාලය

07. සන්නිවේදන අධ්‍යයනය ශාස්ත්‍රීය විෂයක් ලෙස ඉගැන්වීම ආරම්භ කළ පළමු රට වන්නේ
1.ඉන්දියාව 2. එංගලන්තය 3. ශ්‍රී ලංකාව 4. ඇමරිකා එක්සත් ජනපදය 5. චීනය

08. ලෝකයේ ප්‍රථම වරට සන්නිවේදන අධ්‍යනය විෂය ශාස්ත්‍රීය පාඨමාලාවක් ලෙස ඉගැන්වීම් කළ ආයතනය කුමක්ද ?

1. කැළණිය විශ්වවිද්‍යාලය 2. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය 3. දෙහිවල කනිෂ්ඨ විශ්ව විද්‍යාලය 4.කොළඹ විශ්වවිද්‍යාලය 5 ජාතික අධ්‍යාපන ආයතනය

09. ශ්‍රී ලංකාවේ සන්නිවේදන අධ්‍යයනය සඳහා නව අධ්‍යයන අංශයක් ආරම්භ කළ විශ්ව විද්‍යාලය වන්නේ,

1. කොළඹ විශ්වවිද්‍යාලය 2. ශ්‍රී ජයවර්ධනපුර විද්‍යාලය 3. යාපනය විශ්වවිද්‍යාලය

4. දෙහිවල කනිෂ්ඨ විශ්ව විද්‍යාලය 5. කැලණිය විශ්වවිද්‍යාලය

10. ළමයින්ගෙ සමාජ සම්බන්ධතා දුරස් වීම් හා රූපවාහිනී භාවිතය අතර සම්බන්ධතාවයක් පවතින බව පර්යේෂණ මගින් පෙන්වා දුන්නේ,

1.විල්බර් ශ්‍රාම් ය 2. සුනන්ද මහේන්ද්‍ර ය තුන 3. හැරල් ඩී ලැස්වෙල් ය

4. විමල් දිසානායක 5. කර්ට් ලෙවින් ය

**3 වන ඒකකය - මූලික සන්නිවේදනය වර්ග , ස්වරූප හා අකෘති**

**සන්නිවේදනය වර්ග හා ලක්ෂණ**

| | අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය. ලක්ෂණ | | ප්‍රයොජන |
|---|---|---|---|
| 1 | තමා තමා සමගම සිදු කරන සන්නිවේදනය වේ. | 1 | පෞරුෂත්වය වර්ධනය |
| 2 | පුද්ගල මනස හා සම්බන්ධය | 2 | ස්වසංකල්ප පෝෂණය |
| 3 | පුද්ගලයා තමාගේ මනෝභාවයන් සංකල්පනා පුද්ගලික අත්දැකීම් සමග සන්නිවේදනයේ යෙදෙ | 3 | චින්තනය ගොඩ නංවා ගැනීම |
| 4 | පුද්ගලයෙකුගේ මනස අභ්‍යන්තරයේ ක්‍රියාත්මක වන සන්නිවේදන ක්‍රමයකි | 4 | මතක තබා ගැනීම හා තීරණ ගැනීම |
| 5 | යමක් අවබෝධ කර ගැනීමට මතකයේ ගොනු කර ගැනීමට ලබාගත් තොරතුරු ස්වයං විශ්ලේෂණයට හා තීරණ ගැනීම මෙම සන්නිවේදනයෙන් සිදු වේ. | 5 | විචාරශීලීත්වය වර්ධනය කරගැනීම |
| 6 | සෑම සන්නිවේදන ක්‍රියාවලියකම අාරම්භක සන්නිවේදන වර්ගය ෙව්. | 6 | නිර්මාණශීලීත්වය ඔප්නංවා ගැනීම |
| 7 | සංජානනය ප්‍රධාන සන්නිවේදන මූලිකාංග යකි | | |
| 8 | ඇතැම් අවස්ථාවල දී පුද්ගල චර්යා හා ඉරියව්වලින් දැනගත හැකි වේ | | |

| | අන්තර් පුද්ගල සන්නිවේදනයෙ ලක්ෂණ | | | ප්‍රයොජන |
|---|---|---|---|---|
| 1 | පුද්ගලයන් දෙදෙනකු අතර සිදුවේ | | 1 | වඩාත් පහසුවෙන් අන්තර් ක්‍රියාකාරී සන්නිවේදනයක යෙදීමට ඇති හැකියාව |
| 2 | ප්‍රතිචාර හා ප්‍රතිපෝෂණය ක්ෂණිකව සිදුවේ | | 2 | සන්නිවේදන වර්ගයන්ට සාපේක්ෂව පෙළඹවීමේ හැකියාව වැඩිවීම |
| 3 | සජීවී බවින් යුක්ත වේ | | 3 | අන්තර් සබඳතා වර්ධනය කර ගැනීමට හැකි වීම |
| 4 | වාචික මෙන්ම නිර්වාචික ව ද සන්නිවේදනය සිදු කළ හැකි අතර නිර්වාචික ක්‍රම භාවිතයෙන් සන්නිවේදනය ප්‍රබල වේ | | 4 | පහසුවෙන් අන්‍යෝන්‍ය අවබෝධය හා විශ්වාසය තහවුරු කරගත හැකිවීම |
| 5 | සන්නිවේදන බාධක අවම කරගත හැකි වීම | | 5 | වඩාත් ප්‍රිය සන්නිවේදනයකට අවකාශ සැලසීම |
| 6 | තාක්ෂණික උපකරණ භාවිතා කළ හැකි වීම | | 6 | වඩාත් ත්‍රීව්‍ර සහවේදනය ට අවකාශ සැලසීම |
| 7 | මුහුණට මුහුණ ලා සන්නිවේදනය සිදු විය හැකිය | | | |
| 8 | සන්නිවේදක ග්‍රාහක භූමිකා හුවමාරු වේ | | | |
| 9 | පුද්ගලභාවයන් ඉලක්ක කර සන්නිවේදනය යෙදීමේ හැකියාව | | | |
| 10 | පුද්ගල පෞරුෂය හඳුනා ගත හැකි වීම | | | |
| 11 | කාලය පිළිබඳ සීමා පැන නැගීම අවම වීම | | | |
| 12 | පෙළඹවීම හා බලපෑම ප්‍රබල ව සිදු කිරීමට හැකිවීම | | | |
| 13 | අන්තර් සබඳතා ශක්තිමත් කරගැනීමට හේතු වීම | | | |

| | **සමූහ සන්නිවේදනය ලක්ෂණ** | | | **ප්‍රයොජන** | **සමූහ සන්නිවේදනය සාර්ථක කර ගැනීමට උපකාරී වන කරුණු** |
|---|---|---|---|---|---|
| 1 | කිසියම් පිරිසක් හෙවත් සමූහයක් පොදු අරමුණකින් සිදු කරන සන්නිවේදනය කි | | 1 | සමාජයේ පොදු කාර්යයන් වලදී ඉවහල්වේ | පෙර සූදානම |
| 2 | සමූහය යනු කුඩා පිරිසකි | | 2 | විවිධ මතිමතාන්තර අදහස් හා යෝජනා දැනගැනීමට හැකිවීම | අරමුණු සහගත බව |
| 3 | සහභාගි වන පිරිස අනුව ප්‍රතිචාර හා ප්‍රතිපෝෂණය තීරණය වේ | | 3 | පුද්ගල සන්නිවේදන කුසලතා වර්ධනය කර ගැනීමට අවස්ථාව සැලසීම | වාචික සන්නිවේදන විධික්‍රම භාවිතය |
| 4 | සන්නිවේදකයා හා සමූහය අතර සම්බන්ධතාවය පුද්ගලාන්තර සන්නිවේදනය තරම් සමීප ොනාවන අතර ජන සන්නිවේදනය තරම් දුරස්තද නැත. | | 4 | සහභාගි වන පිරිස ගෙන් ප්‍රතිචාර හා ප්‍රතිපෝෂණය ලබාගත හැකිවීම | විවිධ තාක්ෂණික උපකරණ මෙවලම් භාවිතය |
| 5 | සමූහය එකිනෙකා හඳුනන හෝ නොහඳුනන අය විය හැකිය | | 5 | දැනුම සම්පත් ආදිය බෙදා හදා ගැනීමට හැකිවීම | ප්‍රදීපාගාර උපක්‍රමය |
| 6 | සන්නිවේදකයාගේ ප්‍රබලත්වය අනුව සමූහය ග්‍රහණය කරගනිමින් | | 6 | සමාජයීය පොදු කාර්යයන් වලදී ඉවහල් වේ | ආකර්ෂණීය කථන විලාසය |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සන්නිවේදනය ක්‍රියාවලිය සාර්ථක කර ගනී | | | | |
| 7 | සමාජයීය පොදුකාර්ය වල දී ඉවහල්වේ | | | | ග්‍රාහක කේන්ද්‍රීය සන්නිවේදනය |
| 8 | විවිධ මති මතාන්තර අදහස් හා යෝජනා දැන ගැනීමට හැකිවේ | | | | ග්‍රාහක ප්‍රතිචාර පිළිබඳව සැලකිලිමත් වීම |
| 9 | පුද්ගල සන්නිවේදන කුසලතා වර්ධනය කර ගැනීමට අවස්ථාව සැලසේ | | | | කාල කළමනාකරණය |
| 10 | දැනුම සම්පත් ආදිය බෙදා හදා ගැනීමේ හැකියාව | | | | ආචාරශීලීත්වය වගකීම හා වගවීම |

| | මහජන සන්නිවේදනයෙ ලක්ෂණ | ප්‍රයෝජන | උදාහරණ |
|---|---|---|---|
| 1 | ජන සමූහයක් වෙත සිදුකරන සන්නිවේදනයයි | කිසියම් අරමුණක් සදහා ජන සමූහයක් පොළඹවා ගැනීමට හැකි වීම | ප්‍රසිද්ධ රැස්වීම් |
| 2 | ග්‍රාහකයා සන්නිවේදකයා පෙනෙන දුරින් හෝ ඇසෙන දුරින් සිටී. | යම් කරුණක් පිළිබදව වැඩිදුර දැනුවත් කිරිමක් සිදුකිරීමට | ප්‍රසිද්ධ දේශන |
| 3 | සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර සමීප සන්නිවේදන කාර්යයක් සිදු නොවේ. | ප්‍රතිරූප ගොඩනංවා ගැනීමට උපකාරී වීම | විවිධ සැමරුම් උත්සව |
| 4 | ප්‍රතිපෝෂණය ලැබේ. එහෙත් ප්‍රතිපෝෂණය අර්ථකථනය කර ගැනීම අපහසුය. ඇතැම් විට ප්‍රතිපෝෂණය සීමා සහිත වේ. | කිසියම් මතයක් නිර්මාණය කිරීමට හේතු වීම | සංගීත සංදර්ශන |
| 5 | පොදු ජනතාව ඒකරාශී වන ස්ථාන වල ක්‍රියාත්මක වන සන්නිවේදනයකි. | විවිධ පාර්ශව වල අවධානය දිනාගැනිමට හැකි වීම. | |
| 6 | යම් කරුණක් පිරිසකට දැනුම් දීමට,පොළඹවා ගැනිමට හෝ විනොදය ,සතුට ලබා දීමට යොදා ගනී | | |
| 7 | රැස්ව සිටින පිරිසට ගැලපෙන ලෙස සන්නිවේදන අන්තර්ගතය සකස් කර ගැනීමෙන් සාර්ථක සන්නිවේදනයක් සිදුවේ. | | |
| 8 | ඇතැම් අවස්ථාවල විශාල පිරිසක් ඒකරාශී වන නිසා ව්‍යාකූලභාවයක් ඇතිවීමෙන් ග්‍රා.හක අවධානය ගිලිහී යා හැකිය. | | |
| 8 | ග්‍රාහකයා විවිධ ජන කොට්ඨාසයන්ගෙන් සමන්විත විය හැකිය. | | |
| 9 | බොහෝ අවස්ථාවල තාක්ෂණික මෙවලම් භාවිතා කරනු ලබයි. | | |

| | ජන සන්නිවේදනයේ ලක්ෂණ | ප්‍රයෝජන |
|---|---|---|
| 1 | එකිනෙකා නොහඳුනන අතිවිශාල ජන පිරිසක් | ප්‍රජානනය හෙවත් දැනුම ලබාගැනීම |
| 2 | එකවර ඉලක්ක කර ගනිමින් තොරතුරු බෙදා දෙයි. | අපසරණය හෙවත් විකල්ප වෙත යොමු කිරීම |
| 3 | සන්දේශය පොදුය. අන්තර්ගතය සැමවිටම විවෘත වේ. | සමාජ උපයෝගීතාව |
| 4 | ග්‍රාහක පිරිස විෂම ජාතීය. | නිෂ්කර්ෂණය/ පුද්ගලයන්ගෙන් හා කාර්යයන්ගෙන් ඉවත් වී සිටීම |
| 5 | සන්නිවේදකයා සංකීර්ණ විධිමත් ආයතනික රටාවක් පෙන්නුම් කරයි. | |
| 6 | පුළුල් ග්‍රාහක ක්ෂේත්‍රයකි. | |
| 7 | වෘත්තීය සන්නිවේදකයන් සහභාගි වේ | |
| 8 | ක්ෂණික හා අඛණ්ඩ ක්‍රියාවලියකි | |
| 8 | ප්‍රතිපෝෂණය ප්‍රමාදීය . | |
| 10 | ඒකමාර්ගික සන්නිවේදනයකි. | |
| 11 | කර්මාන්ත ස්වරූපයක් ගනී. | |
| 12 | සංකීර්ණ තාක්ෂණයක් සැමවිටම භාවිත කෙරේ. | |

| | අථත්‍ය සන්නිවේදනයේ ලක්ෂණ | විශේෂතා | ප්‍රයෝජන |
|---|---|---|---|
| 1 | අන්තර්ජාලය ඔස්සේ සිදුවන සන්නිවේදනය වේ | කාර්යක්ෂමව සන්නිවේදනයේ යෙදීමේ හැකියාව ඇත. | අධ්‍යාපන කාර්යය සඳහා සිදුකරගැනීමට |
| 2 | සන්නිවේදකයා බොහෝ අවස්ථාවලදී හෞතිකව ලඟාවිය නොහැකි පිරිසක් සමග සන්නිවේදනය යෙදේ | අඩු පිරිවැය | සම්බන්ධතා ගොඩනගා ගැනීමට |
| 3 | සමාජ ජාල වෙබ් අඩවි මාර්ගගත කතාබහ ස්කයිප් ෆේස්බුක් ආදී මෘදුකාංග උපයෝගී කර ගනිමින් සන්නිවේදනය කරයි | ආරක්ෂිත බව | ව්‍යාපාරික කටයුතු සාර්ථකව කර්යක්ෂමව සිදු කර ගැනිම ට |
| 4 | ස්මාර්ට් ජංගම දුරකථනය ලැප්ටොප් පරිගණකය හා පරිගණකය සන්නිවේදන මෙවලම් ලෙස භාවිත වේ | ශ්‍රව්‍ය දෘශ්‍ය අංග සහිතව සන්නිවේදනය යෙදීමේ හැකියාව | ප්‍රචාරණ කටයුතු සඳහා |
| | | එකවර පුද්ගලයින් රැසක් සමග සන්නිවේදනය යෙදීමේ | නිර්මාණාත්මක කාර්යය සඳහා චින්තනය පුබුදුවාලීම සඳහා |
| | | හෞතික වශයෙන් ඉඩකඩ අවශ්‍ය නොවීම | |

ඇගයීම 2

1.පහත ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න. සෑම ප්‍රශ්නයකටම ලකුණු 8 ක් හිමිවේ.

1. අන්තර්වර්තීපුද්ගල සන්නිවේදනයේ ලක්ෂණ හතරක් කෙටියෙන් විස්තර කරන්න.
2. අන්තර්පුද්ගල සන්නිවේදනයේ ලක්ෂණ හතරක් කෙටියෙන් විස්තර කරන්න.
3. සමූහ සන්නිවේදනයේ ලක්ෂණ හතරක් කෙටියෙන් විස්තර කරන්න.
4. මහජන සන්නිවේදනයේ ලක්ෂණ හතරක් කෙටියෙන් විස්තර කරන්න.
5. ජන සන්නිවේදනයේ ලක්ෂණ හතරක් කෙටියෙන් විස්තර කරන්න.
6. අථත්‍ය සන්නිවේදනයේ ලක්ෂණ හතරක් කෙටියෙන් විස්තර කරන්න.

7. අන්තර්වර්තීපුද්ගල සන්නිවේදනයේ ප්‍රයෝජන හතරක් කෙටියෙන් විස්තර කරන්න
8. අන්තර්පුද්ගල සන්නිවේදනයේ ප්‍රයෝජන හතරක් කෙටියෙන් විස්තර කරන්න.
9. සමූහ සන්නිවේදනයේ ලක්ෂණ ප්‍රයෝජන හතරක් කෙටියෙන් විස්තර කරන්න.
10. මහජන සන්නිවේදනයේ ලක්ෂණ ප්‍රයෝජන හතරක් කෙටියෙන් විස්තර කරන්න.
11. මහජන සන්නිවේදනයේදි ග්‍රාහකයා ආකර්ෂණය කර ගැනීමට යොදාගතහැකි සන්නිවේදන උපක්‍රම හතරක් කෙටියෙන් විස්තර කරන්න.
12. ජන සන්නිවේදනයේ ලක්ෂණ ප්‍රයෝජන හතරක් කෙටියෙන් විස්තර කරන්න.
13. අතථ්‍ය සන්නිවේදනයේ ලක්ෂණ ප්‍රයෝජන හතරක් කෙටියෙන් විස්තර කරන්න.

2. පහත ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න. සෑම ප්‍රශ්නයකටම ලකුණු 4 ක් හිමිවේ.

1. යන්ත්‍රසහායක පුද්ගලාන්තර සන්නිවේදනයේදි යොදාගතහැකි තාක්ෂණික ක්‍රමවේද හතරක් නම් කරන්න.
2. සමූහ සන්නිවේදනය සාර්ථක කර ගැනීමට පෙර සූදානම් වන විධික්‍රම හතරක් ලැයිස්තු ගත කරන්න.
3. මහජන සන්නිවේදනයේදි යොදාගතහැකි තාක්ෂණික මෙවලම් හතරක් නම් කරන්න.
4. ජනමාධ්‍ය නම් කර වර්ග කරන්න.
5. අථත්‍ය සන්නිවේදනයේ විශේෂතා හතරක් ලියන්න.

සන්නිවේදන ස්වරූප

| | වාචික සන්නිවේදනය<br>කිසියම් භාෂාවක පවතින ශබ්ද රටා හා වචන රටා භාවිත කරමින් සිදු කරන සන්නිවේදනයයි. | | |
|---|---|---|---|
| | ලක්ෂණ | කුසලතා | ප්‍රයෝජන |
| 1 | භාෂාවක් දැන සිටීම අවශ්‍ය වීම | වාක්කෝෂය පුළුල් කර ගැනීම | ඉගැන්වීම,උපදෙස් දිම හා මගපෙන්වීම |
| 2 | භාෂාව පිළිබඳ නිපුනතාවයක් අවශ්‍ය නොවීම | තමා සතු අදහස් තොරතුරු ඇතුළත් දැනුම වර්ධනය කර ගැනීම | පුද්ගලයින් අතර තොරතුරු හුවමාරුව |
| 3 | දෙපාර්ශවයම එකම භාෂාවක් දැන සි | පෙර සූදානම | මානව සබදතා පවත්වාගැනිම |
| 4 | පෙර සූදානම ප්‍රයෝජනවත් වීම | ඉදිරිපත් කිරීමේ කුසලතා වැඩි දියුණු කර ගැනීම | සිතෙහි ඇතිවන භාවයන් ප්‍රකාශයට පත්කිරීම |
| 5 | වගකීමෙන් යුතුව භාෂාව භාවිතය | යෝග්‍ය භාෂාවක් භාවිත කළ හැකි වීම | පුද්ගල පෞරුෂය ඇති කිරීම හා විවිධ කාර්යයන් ඉටුකර ගැනීම |

| | | | |
|---|---|---|---|
| 6 | සන්නිවේදකයා දන්නා භාෂාවකින් නොව ග්‍රාහකයාට තේරෙන භාෂාවකින් කථා කිරීම | පෞද්ගලික අනන්‍යතාවයක් හා ස්වීයත්වයක් ගොඩනගා ගැනීමට හැකි වීම | |
| 7 | ව්‍යාකරණයෙන් තොරව ද සිදුවිය හැකිය. | වගකීමෙන් යුතුව වචන භාවිතා කිරීමේ හැකියාව | |
| 8 | ප්‍රකාශ කළ පසු ආපසු ගත නොහැකි වීම. | | |
| 9 | කථන හා ලිඛිත ආකාර දෙකෙන්ම පැවතීම | | |
| 10 | පහසුවෙන් අවබෝධ කර ගැනීම | | |

| | |
|---|---|
| | නිර්වාචික සන්නිවේදනය - ලිඛිත හෝ වචන භාවිතයෙන් තොරව සිදු කරන සන්නිවේදනයයි. |
| | ලක්ෂණ |
| 1 | වචන භාවිතයෙන් තොරව සිදුවේ |
| 2 | සන්නිවේදනය සඳහා ප්‍රධාන වශයෙන් සිරුරු බස,සංඥා හා සංකේත භාවිත වේ. |

| | | |
|---|---|---|
| | කථන සන්නිවේදනය - මුවින් පිටවන වචන හා ශබ්ද අනුසාරයෙන් විවිධ අර්ථ ජනනය කිරීම කථන සන්නිවේදනයයි | |
| | ලක්ෂණ | සන්නිවේදන කුසලතා වර්ධනයට කළ හැකි දේ |
| 1 | භාෂාවක් භාවිතයෙන් අන්‍යෝන්‍ය වශයෙන් අදහස් හුවමාරු කර ගනී. | සවන් දීම |
| 2 | දෛනික සන්නිවේදනයේදි භාවිත වේ | කියවීම |
| 3 | ආචාරශීලීව, ආකර්ෂණීයව, අර්ථපූර්ණව භාෂාව භාවිතයෙන් සාර්ථක සන්නිවේදනයක් සිදුවේ. | දක්ෂ කථිකයන්ගේ කථා අනුකරණය කිරීම |
| 4 | නිරායාසයෙන් සිදුවන සන්නිවේදනයකි | කථන පුහුණුව |
| 5 | ස්වාභාවිකය | තනි පුද්ගලයෙකුට ඇමතීම |
| 6 | ග්‍රාහකයාට අනුව වචන තෝරා ගනී | හඬ නගා උච්චාරණය |
| 7 | නිර්වාචික සන්නිවේදනයේ උදව් ලබා ගනී | විවිධ දේ කථනයෙන් ඉදිරිපත් කිරීම |

| | | |
|---|---|---|
| 8 | සන්නිවේදකයා හෙවත් ඉදිරිපත් කරන්නා සැමවිටම ශාරීරිකව පෙනී සිටී. | |

| | | |
|---|---|---|
| | රූපණය/ ප්‍රාසාංගික ක්‍රියාකාරකමක් වශයෙන් හෝ වෘත්තියක් වශයෙන් යම් රංගනයක යෙදීම රූපණය නම් වේ | |
| | ලක්ෂණ | රූපණ කුසලතා වර්ධනයට කළ හැකි දේ |
| 1 | ආචාරශීලීව කතාබහේ යෙදීමේ සිට පුද්ගල ජීවිතයේ සියලුම සන්නිවේදන කාර්යයන් සඳහා රූපණය භාවිත වේ. | රූපන අවස්ථා නිරීක්ෂණය |
| 2 | එකම පුද්ගලයෙකු එක් එක් අවස්ථාව හා භූමිකාව අනුව රූපණය යොදා ගනි | අනුකරණය |
| 3 | ප්‍රධාන වශයෙන් සිනමාවේදී වේදිකාව ටෙලිනාට්‍ය වැනි මාධ්‍යයන් හිදී වෘත්තියක් වශයෙන් රූපණය යොදා ගනී. එමෙන්ම නිර්මාණශීලී සන්නිවේදනයේදී රූපණය ඉතාම වැදගත් වේ . | විවිධ අවස්ථා අනුව රූපණ වෙනස් වන ආකාරය අවබෝධ කර ගැනීම |
| 4 | උපකරණ හැඩගැන්වීම් ඇඳුම් පැලඳුම් වැනි දේ භාවිතා කිරීමෙන් රූපණය ප්‍රබල කර ගත හැකිය. | විවිධ සන්නිවේදන අවස්ථා රූපණයෙන් ඉදිරිපත් කිරීම |

| | | |
|---|---|---|
| | ලිඛිත සන්නිවේදනය -භාෂාව හා සංකේත මගින් තොරතුරු ඉදිරිපත් කිරිම ලිඛිත සන්නිවේදනයයි. | |
| | ලක්ෂණ | ලිඛිත සන්නිවේදන කුසලතා වර්ධනයට හේතු වන කරුණු |
| 1 | ලිපිත සන්නිවේදනය නිර්මාණාත්මක ක්‍රියාකාරකමකි. උදාහරණ ලෙස දැන්වීම් චක්‍රලේඛ වාර්තා පුවත්පත් සඟරා ආදිය දැක්විය හැකිය. | ලිවීමේ කුසලතා හඳුනා ගැනීම |
| 2 | සාක්ෂරතාවය අත්‍යවශ්‍ය වේ | සාක්ෂරතාව |
| 3 | කියවීමට හැකි ජනතාව සඳහා තොරතුරු ඉදිරිපත් ඉදිරිපත් කිරීමට සීමාවේ. | පොතපත කියවීම |
| 4 | කථන සන්නිවේදනය ට සාපේක්ෂව වඩාත් සංවිධානාත්මකව ගොඩනැගිය හැකිය | නිරවුල්ව පැහැදිලිව සංවිධානාත්මකව ලිපි ලේඛන ලිවීම |
| 5 | අනාගත භාවිතය සඳහා තොරතුරු ගබඩා කර තබා ගැනීමට හැකියාව ඇත | නිර්මාණශීලීභාවය වර්ධනය කර ගැනිම |

| | | |
|---|---|---|
| 6 | අධ්‍යාපන නිර්මාණාත්මක ලේඛන කාර්යය ආයතනික කටයුතු සහ නීතිමය කාර්යය ආදී කාර්යය සඳහා ලිඛිත සන්නිවේදනය ඉතා අවශ්‍ය වේ | |
| 7 | නිවැරදි ලෙස ලේඛනය සිදු නොවුණහොත් වැරදි අවබෝධ ඇති වීම අවදානම් පවතී | |

| | | |
|---|---|---|
| | ශ්‍රව්‍ය සන්නිවේදනය- සවන්දීම පදනම් කර ගත් ශබ්ද මාධ්‍යයේ ඕනෑ ම වර්ගයක සම්ප්‍රේෂණ ස්වරූපයක් ශ්‍රව්‍ය සන්නිවේදනය නම් වේ. | |
| | ලක්ෂණ | කුසලතා වර්ධනය |
| 1 | ශ්‍රවණ ඉන්ද්‍රිය මුල්කරගෙන සන්නිවේදනය සිදුවේ. | හොඳින් සවන් දීම |
| 2 | හඬවල් ශ්‍රවණය කිරීමෙන් යම් යම් තොරතුරු හා අදහස් සන්නිවේදනය වේ ස්වාභාවික ශබ්ද කෘතිම ශබ්ද, සංගීතය, නිහඬබව මිනිස් කටහඬ උදාහරණ වේ. | විවිධ හඬවල් වෙන්කර හඳුනාගැනීම |
| 3 | වර්තමානය වන විට විධිමත් ලෙස හඬ භාවිතා වන අවස්ථා දැකිය හැකිය. උදාහරණ ගිලන් රථය හඬ ගිනි නිවන රථයේ හඬ | ශ්‍රව්‍ය සන්නිවේදන අවස්ථා අධ්‍යනය කිරීම |
| 4 | තාක්ෂණික දියුණුව නිසා වර්තමානයේ විවිධ ස්වරූපයෙන් හඬ මෙවලම් භාවිත කරයි උදාහරණ ගුවන් විදුලිය | විවිධ ශබ්ද භාවිත කරමින් නිර්මාණය කිරීම |
| 5 | වර්තමානයේ හඬ සංරක්ෂණය කර ගැනීමට තාක්ෂණය යොදා ගනී සීඩී තැටි, පටිගත කිරීම්, සංගීත තැටි | |
| 6 | කටහඬ මගින් විවිධ සන්නිවේදනයන් සිදුවන අතර පුද්ගලයෙකුගේ හඬ ඔහුගේ පෞරුෂ හැකියාවන් පෙන්නුම් කරයි. | |

| | | |
|---|---|---|
| | දෘශ්‍ය සන්නිවේදනය- ඇස උපයෝගී කොටගෙන දැකීමෙන් හා බැලීමෙන් අදහස් හා තොරතුරු එක්රැස් කර ගැනීමයි. | |
| | ලක්ෂණ | කුසලතා වර්ධනය |
| 1 | සංඥා, මුද්‍රණාක්ෂර, ග්‍රැෆික් නිර්මාණ, චිත්‍ර සටහන්, වර්ණ, සජීවිකරණය, චිත්‍රපටිය ආදී අංග රැසක් අයත් වේ. | රූප මැනවින් දැකීම |
| | වර්තමානයේ සන්නිවේදන තාක්ෂණ දියුණුව සමඟ,අන්තර්ජාලය, සමාජ මාධ්‍ය, රූපවාහිනිය ඉතා නිර්මාණශීලීව හා ආකර්ෂණීය ලෙස දෘශ්‍ය සන්නිවේදනය ප්‍රබලව භාවිත කරයි. | රූප හඳුනාගැනීම<br>අධ්‍යාපනික කාර්යය සඳහා රූප භාවිතයට ගැනීම<br>දෘශ්‍ය සන්නිවේදන අංග යොදා ගනිමින් නිර්මාණය කිරීම |

| | | |
|---|---|---|
| | | |

| | |
|---|---|
| | විධිමත් සන්නිවේදනය |
| | ලක්ෂණ |
| 1 | සන්නිවේදකයා පැහැදිලිව හඳුනාගත හැක |
| 2 | සන්නිවේදකයා විසින් ඉදිරිපත් කරන සන්දේශයෙහි වගකීමක් ඇත |
| 3 | සංදේශය වගකීමක් සහිත ලේඛනයක් හෝ ප්‍රකාශනයක් වේ උදාහරණ ලෙස නිල වාර්තා සිහිකැඳවීම් ලිපි ශීර්ෂ සහිත ලිපි ගැසට් නිවේදන නිල විද්‍යුත් තැපැල. නිල වශයෙන් සිදුකරන ප්‍රකාශන ලෙස, වාර්ෂික අයවැය වාර්තාව රාජ නායකයන් විසින් සිදු කරනු ලබන නිල ප්‍රකාශන. |
| 4 | නිශ්චිත ධුරාවලියක් සහිතව ක්‍රියාත්මක වේ |
| 5 | කාලයක් හා වේලාවක් හා ස්ථානයක් හඳුනාගත හැකිය |
| 6 | කිසියම් ක්‍රියා පටිපාටියකට අනුව ක්‍රියාත්මක වේ |
| 7 | සන්නිවේදනය ක්‍රියාත්මක වන්නේ අරමුණක් සහිත ඵලදායි සන්නිවේදන ස්වරූපයක් ලෙසයි |

| | |
|---|---|
| | අවිධිමත් සන්නිවේදනය |
| 1 | සංදේශය හෝ තොරතුර ලබා දෙන්නෙක් පැහැදිලිව හඳුනාගත නොහැක. |
| 2 | තොරතුරු මූලාශ්‍රය පැහැදිලි නැත. |
| 3 | ලබාදෙන සංදේශය නිල ස්වභාවයක් හෝ වගකීම් දරන්නෙකු ද නැත උදාහරණ කතා ඕපාදූප කැලෑ පත්තර |
| 4 | නිශ්චිත වේලාවක් ස්ථානයක් හෝ ක්‍රියා පරිපාටියක් ක්‍රියාත්මක නොවේ. |
| 5 | ඉතා වේගවත්ය. ඉතා වේගයෙන් තොරතුරු ග්‍රාහක ගතවේ. |
| 6 | ජනතාවගේ හැඟීම් ආකල්ප විරෝධතා ආදිය ප්‍රකාශ කිරීමේ ඉඩකඩ වැඩිය. |
| 7 | තාක්ෂණික ක්‍රම වඩා ප්‍රබලව යොදා ගනී උදාහරණ දුරකතනය, සමාජ ජාලා |
| 8 | සැකය හා කුතුහලය මත ක්‍රියාත්මක වේ. |
| 9 | විධිමත් සන්නිවේදනයට සාපේක්ෂව තොරතුරු වැඩි ප්‍රමාණයක් ලබාගත හැකිය. |
| 10 | නිශ්චිත ධුරාවලියක් නැත. |

ඇගයීම 3

1.පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න. ප්‍රශ්නයකට ලකුණු 8 ක් හිමි වේ.

1. වාචික සන්නිවේදනයේ ලක්ෂණ දෙකක් කෙටියෙන් විස්තර කරන්න.
2. නිර්වාචික සන්නිවේදනයේ ලක්ෂණ දෙකක් කෙටියෙන් විස්තර කරන්න.
3. කථන සන්නිවේදනයේ ලක්ෂණ දෙකක් කෙටියෙන් විස්තර කරන්න.
4. රූපණ සන්නිවේදනයේ ලක්ෂණ දෙකක් කෙටියෙන් විස්තර කරන්න.
5. ලිඛිත සන්නිවේදනයේ ලක්ෂණ දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

6. ශ්‍රව්‍ය සන්නිවේදනයේ ලක්ෂණ දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

7. දෘශ්‍ය සන්නිවේදනයේ ලක්ෂණ දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

**2. පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න. ඒක් ප්‍රශ්නයකට ලකුණු 4 ක් හිමි වේ.**

1. වාචික සන්නිවේදනයේ කාර්යයන් හතරක් ලැයිස්තුගත කරන්න.

2. සන්නිවේදකයෙකු සතුවිය යුතු වාචික සන්නිවේදන කුසලතා හතරක් ලියන්න.

3. සමූහ සන්නිවේදනයේදී සන්නිවේදකයාට සිරුරු බස යොදා ගත හැකි විධික්‍රම හතරක් ලියන්න.

4. කථන සන්නිවේදන කුසලතා වර්ධනය කර ගැනිමට හේතුවන කරුණු හතරක් ලියන්න.

5. රූපණ සන්නිවේදන කුසලතා වර්ධනය කර ගැනිමට හේතුවන කරුණු හතරක් ලියන්න.

6. ශ්‍රව්‍ය සන්නිවේදන කුසලතා වර්ධනය කර ගැනිමට හේතුවන කරුණු හතරක් ලියන්න.

7. දෘශ්‍ය සන්නිවේදන කුසලතා වර්ධනය කර ගැනිමට හේතුවන කරුණු හතරක් ලියන්න.

**3. පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න. ඒක් ප්‍රශ්නයකට ලකුණු 12 ක් හිමි වේ.**

1. විධිමත් හා අවිධිමත් සන්නිවේදනය අතර පවතින වෙනස්කම් තුනක් විස්තර

**පසු විපරම - සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනයේ 1 වන හා 2 වන ඒකක වලට අදාල ප්‍රශ්න සැකසෙන ආකාරය පිළිබද අවබෝධය ලබාදිම හා ප්‍රශ්නයකට ලිවිය යුතු කරුණු ප්‍රමාණය පිළිබදව වැටහීමක් ලබා ගන්න මෙම මොඩියුලය උපකාර කර ගන්න.**